# භාෂා ව්‍යවහාරය පිළිබඳ බෞද්ධ ආකල්පය

ආචාර්ය පූජ්‍ය පිටිගල විජිත හිමි

බුදුරජාණන් වහන්සේ භාෂා භාවිතය පිළිබඳව සුවිශේෂ අවධානයක් යොමුකොට ඇති බව බෞද්ධ මූලාශ්‍රවලින් ප්‍රකට වේ. ශ්‍රේෂ්ඨ ධර්ම සන්නිවේදකයාණ කෙනෙකුන් වශයෙන් ස්වකීය අදහස් අන්‍යයන්ට සන්නිවේදන කිරීමේ මාධ්‍යය භාෂාව වන බැවිනි. බුදුරජාණන් වහන්සේ භාරතය පුරාම ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරතවෙමින් ස්වකීය ශ්‍රාවකයන් එම කාර්‍යයෙහි නිරත කරවමින් සිටි නිසා භාෂාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වූ බව පෙනේ. බුදුරජාණන් වහන්සේ ලොව විසූ ප්‍රබලතම ධර්ම සන්නිවේදකයාණෝ වූහ. එබැවින් සන්නිවේදනයෙහිලා භාෂාවේ වැදගත්කම උන්වහන්සේ තේරුම් ගෙන සිටි බවට සැක නැත. තත් කාර්‍යය සාර්ථකව සිදුකිරීම සඳහා භාෂාව කෙලෙස උපයෝගී කරගත යුතු ද යන්න තම අවධානය යොමු කළා පමණක් නොව ඒ සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේට ද උපදෙස් දුන් බව සනාථ වේ.

බුදුරජාණන් වහන්සේ අවබෝධ කරගත් ලෝකෝත්තර ශ්‍රී සද්ධර්මය ලෞකික වචනවලින් විස්තර කිරීමේ දී ජනතාවට එය කෙතෙක් දුරට අවබෝධ කරගත හැකිවේ ද? එසේ අවබෝධයට දුෂ්කර වුවහොත් එසේ වන්නේ කවර හෙයින් ද? එම දුර්වලතාවන් දුරුකළ හැක්කේ කෙළෙස ද? යනාදී කරුණු විෂයෙහි උන්වහන්සේ ගේ අවධානය යොමුව පැවති බව මුල් බුදුසමය තුළින් ප්‍රකට වේ.

පුද්ගල සමාජය විවිධය, විචිත්‍රය, භින්නරුචිකය, කායික මානසික වශයෙන් විචිත්‍ර වූ ජන විඥානය ඇතැඹුලක්සේ පසක්කරගත් බුදුරජාණන් වහන්සේ පරහට ධර්මදේශනා කිරීමට පෙළඹුණහ. උන්වහන්සේ අවබෝධ කරගත්ව ධර්මය ගැඹුරුය (ගම්භිරො) දුකින්දතයුතු වේ, (දුද්දසො) දුරනුබෝධ වේ. (දුරනුබොධො) ශාන්ත වේ. (සන්තො) ප්‍රණිත වේ (පණිතො) තර්කයෙන් නො දතහැකි වේ. (අතක්කාවචරො) සියුම් වේ. (නිපුණො) පණ්ඩිතයන් විසින් ම දතයුතු වේ. (පණ්ඩිතවෙදනීයො) යැයි ද, දුකසේ අවබෝධ කරන ලද මේ ධර්මය රාගද්වේෂයන්ගෙන් පෙළෙන්නන් විසින් පහසුවෙන් අවබෝධ කරනු නොහැකි වන්නේ යැයි ද කල්පනා කොට අන්‍යයන්ට ධර්මදේශනා කිරීමට බුදුරජාණන් වහන්සේ උකටලි වූ බව සඳහන් වේ.[1] උක්ත දේශනා පාඨය අනුව ධර්මය තේරුම් ගැනීමට සාමාන්‍ය ජනතාවට නොහැකි වන්නේ ඔවුන් පඤ්චකාමයන් හි ඇලී ගැලී බැඳී සිටින බැවිණි. එසේනම් අනුසෝතගාමී වන ඔවුහු පටිසෝතගාමී මඟට ගත යුතුය. එසේ යහපත් මාර්ගයට ගැනීමට පහසු රාගාදී කෙලෙස් අඩු පුද්ගලයන් ද කෙලෙස් බහුල අය ද, සිටින බව ශාක්‍ය මුණිඳුයන් වහන්සේ දැන සිටියහ.[2] එසේ ම ප්‍රථමයෙන් ධර්ම දේශනා කිරීම සඳහා උන්වහන්සේගේ අවධානයට පාත්‍ර වූ පුද්ගලයෝ ද, යමක් අවබෝධ කරගන්න තරම් හොඳ ඥාන ශක්තියක් තිබූ අය වූහ. උන්වහන්සේ ධර්මය මනාව වැටහී යන අයට ඉතා සංක්ෂිප්තව ධර්මය දේශනා කළ අතර වැටහීම දුර්වල අයට විස්තර සහිතව ධර්මය දේශනා කළහ. මේ නිසා උන්වහන්සේගේ ධර්ම දේශනා සංඛිත්ත දෙසනා, විත්ථාර දෙසනා වශයෙන් ද්විධ වූ බව දැක්වේ.[3] සංඛිත්ත යනු සංශ්ලේෂණ හෙවත් කෙටි දේශනයයි, විශ්ලේෂණ හෙවත් සවිස්තර දේශනා ක්‍රමය

විත්ථාර නම් වේ. මෙම දේශනා ක්‍රම දෙක ම සුදුසු අවස්ථාවන්හි බුදුරජාණන්වහන්සේ භාවිත කොට ඇති බව සූත්‍ර දේශනාවන්ගෙන් පැහැදිලි වේ.

භාෂා ව්‍යවහාරය සම්බන්ධයෙන් බුදුසමයේ ආකල්පය හඳුනා ගැනීමට උපකාර වන වැදගත් ප්‍රවෘත්තියක් චුල්ලවග්ගපාලියෙහි සඳහන් වේ.[4] බ්‍රාහ්මණ වංශික ''යමෙළු, තෙකුල'' යන භික්ෂූන් වහන්සේ දෙනම බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ, නොයෙක් කුලගෝත්‍රවලින් පැවිදිව සිටින අය තමතමන්ගේ භාෂාවෙන් ධර්මය දේශනා කරමින් බුද්ධවචනය දූෂණය කරන බැවින් බුද්ධවචනය ඡන්දසට නැගීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටියහ. එවිට බුදුන්වහන්සේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කොට, ස්වකීය නිරුක්තියෙන් ධර්මය ප්‍රගුණ කළ යුතු බව වදාළහ. මෙහි දී ''සකාය නිරුත්තියා'' යන්නෙන් අදහස් කළ අර්ථය පිළිබඳ වියතුන් අතර මතභේද පවතියි. අර්ථකථාචාර්ය බුද්ධඝොෂ හිමියන්ගේ අදහස වන්නේ ''සකාය නිරුත්තියා'' යන්නෙන් අදහස් කළ අර්ථය පිළිබඳ වියතුන් අතර මතභේද පවතියි. අර්ථකථාචාර්ය බුද්ධඝොෂ හිමියන්ගේ අදහස වන්නේ ''සකාය නිරුත්තියා'' යන්නෙන් මාගධී හෙවත් පාලි භාෂාව අදහස් කරණ බවයි. මෙහිලා අවධානය යොමු විය යුත්තේ යමෙළු, තෙකුල දෙදෙනාගේ ඉල්ලීම වෙතටයි. එනම් බුද්ධවචනය ඡන්දසට නැගීමයි. එම ඉල්ලීම බුදුරජාණන් වහන්සේ ප්‍රතික්ෂේප කරමින් දෙසන ලද්දේ ස්වකීය නිරුත්තියෙන් බුද්ධ වචනය ඉදිරිපත් කළ යුතු බවයි. එපමණක් නොව යමෙක් ඡන්දසට නගන්නේ නම් දුකුලා ඇවතක් සිදුවන බව ද අවධාරණය කළහ.[5] සැබවින් ම මෙමගින් ගම්‍ය වන අර්ථය නම් ඒ ඒ ජනපදයන්හි වාසය කරණ ජනයා භාවිත කරන භාෂාවෙන් හෙවත් තමතමන්ගේ මාතෘ භාෂාවෙන් බුදුදහම හැදෑරිය යුතු බවයි. ''ඡන්දසො'' යන පදයෙන් ගම්‍ය වන අර්ථය කුමක්දැයි මෙහිලා පරීක්ෂා කළ යුතුය. බුද්ධඝොෂ හිමියන් ගේ අදහස වන්නේ මෙමගින් සංස්කෘත භාෂාව හැඳින්වන බවයි.[6] ශුද්ධ වූ සංස්කෘත භාෂාවෙන් පමණක් බුද්ධභාෂිතය පවත්වාගෙන යෑමට යෝජනා කරන්නට ඇත්තේ තත්කාලීන ඇතැම් භික්ෂූන් වහන්සේලා පාලි භාෂාව සම්බන්ධයෙන් දක් වූ දුර්වලතාව යැයි උපකල්පනය කළ හැකි ය. එතකුදු නොව එකල සංස්කෘත භාෂාවට හිමි වී තිබුණ ප්‍රමුඛතාවය ද හේතුවන්නට ඇත. කෙසේ වෙතත් මෙහිලා භාෂාමය ගැටලුවක් මතු වී ඇති බව ප්‍රකට වේ. එහෙත් බුදුරජාණන් වහන්සේ දෙසන ලද්දේ තමතමන් ව්‍යවහාර කරණ භාෂාවෙන් පවත්වාගෙන යායුතු බවයි. භාෂාව සම්බන්ධයෙන් බුදුරජානන් වහන්සේ තුළ පැවැති සහනශීලී නිදහස් නිවහල් ආකල්පය මෙයින් ගම්‍ය කෙරේ. යමක් මැනවින් අවබෝධ කරගත හැක්කේ ස්වභාෂිකයෙකුට ම බව බුදුරජාණන් වහන්සේ දැන සිටි බව ද මෙමගින් ප්‍රකට වේ.

භාෂා ව්‍යවහාරය සම්බන්ධයෙන් තවත් වැදගත් සාධකයක් නම් මජ්ඣිමනිකායාගත අරණවිභංග සූත්‍රයයි.[7] භාෂා ව්‍යවහාරය ඉක්මවා යෑම හේතුවෙන් විවිධ දෘෂ්ටි ජනනය වේ. සමාජයේ එකිනෙකා අතර වාදවිවාද මතිමතාන්තර ඇති වී වාග් සංග්‍රාමයන් උත්පාදනය වන ආකාරය මෙම සූත්‍රයෙහි විස්තර වේ. නගරයෙන් නගරයට, ජනපදයෙන් ජනපදයට, එක ම භාෂාවක් වූව ද ව්‍යවහාරය අනුව විවිධත්වයට විචිත්‍රත්වයට පාත්‍රවන ආකාරය දක්නට ලැබේ. සූත්‍රාගත උදාහරණයක් පහත දක්වේ. ''භාජනය'' හැඳින්වීම සඳහා භාවිත වී ඇති වචන කිහිපයක් පහත සඳහන් වේ.

''පාති, පත්ත, විත්ථ, සරාව, ධාරොප, පොන, සිසිල''

යන නම් රාශිය ම එක ම දෙයක් හැඳින්වීම සඳහා විවිධ ජනපදයන්හි විවිධාකාරයෙන් භාවිත වී ඇත. ඒ ඒ ජනපදයන්හි ව්‍යවහාර වන වචන භාවිත නොකොට වෙනත් වචන භාවිතා කළහොත් ව්‍යවහාරය ඉක්මවා යෑම හේතුවෙන් විවිධ ගැටලු ඇති වේ. එබැවින් ව්‍යවහාරය අතික්‍රමණය නොකොට, ඒ ඒ ජනපදයන්හි වාසය කරණ ජනයා ''භාජනය'' හැඳින්වීම සඳහා විවිධ වචන ව්‍යවහාර කරන බව අවබෝධ කරගෙන ක්‍රියාකිරීම වැදගත් වේ. භාෂාවක් ජීවමානත්‍වයට පත් වන්නේ ව්‍යවහාර වූ තරමටයි. ව්‍යවහාර වන තරමට එය පෝෂණය ද වේ. අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාත්මක වන සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වීම සඳහා භාෂා ඥානය අත්‍යවශ්‍ය වේ. ජනපද නිරුක්ති හෙවත් ඒ ඒ ජනපදවාසීන් ව්‍යවහාර කරණ භාෂාව සහ එහි විවිධ ප්‍රයෝගයන් පිළිබඳ නිපුණතා, කුශලතා ඇත්තෙකුට ගැටලු ඇතිනොවන පරිදි භාෂාව භාවිත කළ හැකි වේ යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ඒ හේතුවෙනි.

ධර්‍ම සන්නිවේදකයෙකු විසින් අනුගමනය කළ යුතු කරුණු පහක් පිළිබඳව අංගුත්තර නිකායේ ඇතුළත් වේ. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනය සඳහා ආනන්ද හිමියන්ට උපදෙස් දෙමින් කරුණු පහක් සිත්හි දරාගෙන ධර්ම දේශනා කළ යුතුයැයි පෙන්වා දුන්හ.[8] එනම්

1. අනුපිළිවෙළ කථාව කියන්නෙමියි (අනුපුබ්බිකථං කථෙස්සාමීති) අනුන්ට දම් දෙසිය යුතු ය.
2. කරුණු හෙවත් පර්‍යායය දක්වන්නෙමියි (පරියාය දස්සාවි) අනුන්ට දම් දෙසිය යුතු ය.
3. අනුකම්පා පිණිස ධර්ම කථා කියන්නෙමියි (අනුද්දසනං පටිච්ච) අනුන්ට දම් දෙසිය යුතු ය.
4. ලාභාපේක්ෂා නැතියෙමියි (න ආමිස්සන්තරො) අනුන්ට දම් දෙසිය යුතුය.
5. තමා හා අනුන් නොගටා දම් දෙසන්නෙමියි (අත්තානංච පරංච අනුපහච්ච අනුන්ට දම් දෙසිය යුතු ය.[9]

යනු එම සිත්හි දරාගත යුතු කරුණු පහයි.

යථෝක්ත කරුණු අතුරින් එක, දෙක සහ පහ භාෂාව සම්බන්ධයෙන් වැදගත් කරුණු වෙයි. පළමු වැනි කාරණයට අනුව අසන්නාට වැටහෙන ආකාරයට අනුපිළිවෙළින් කරුණු ඉදිරිපත් කළ යුතු ය. මෙහි දී දන්නා දෙයින් නොදන්නා දෙයට යාම සිදුකරයි. දාන කථා සීල කථා ස්වර්‍ග කථා ආදි වශයෙන් ලෞකිකත්‍වයේ සිට පරම ලෝකෝත්තර නිවන දක්වා ක්‍රමයෙන් ගමන් කිරීම මෙයින් සිදුවෙයි. පර්‍යායය දැක්වීම වශයෙන් දක්වා ඇති දෙවැනි කාරණය ද අතිශය වැදගත්වේ. භාෂාවේ යම් යම් වචන එක් එක් පර්‍යායයේ දී දක්වන්නේ එකම අදහස නොවේ. විවිධ පර්‍යායයන්ට අනුව අර්ථය වෙනස් වෙයි. යමක් මනාව වටහා ගැනීමට නම් පර්‍යායය දැක්විය යුතු ය. මේ අනුව පර්‍යායය දැක්වීම වශයෙන් හඳුන්වන්නේ භාෂාමය දැනුම පිළිබඳ කරුණක් බව කිව හැකි ය. ඒ අතරම තමා පාවිච්චි කරන භාෂාව තමා හා අනුන් නොගැටෙන අයුරින් භාවිත කිරීම වැදගත් වෙයි. ගැටුම් ඇතිවන්නේ වැරදි වැටහීම් හේතුවෙනි. එම තත්ත්වයෙන් මිදීම සඳහා මනා භාෂා දැනුමක් තිබීම වැදගත් කොට බුදුරජාණන් වහන්සේ සලකා ඇති බව මෙමගින් මනාව ප්‍රකට වේ.

මෙහිලා අවධානය යොමු කළ යුතු තවත් වැදගත් කරුණක් නම් බුදුරජාණන් වහන්සේ ප්‍රථම ක්ෂීණාශ්‍රව රහතන් වහන්සේ හැටනම අරභයා කරණ ලද අවවාදාත්මක දේශනාවයි. එහිදී, ''දෙසෙථ භික්ඛවේ ධම්මං ආදි කල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ''[10] යනුවෙන්

මහණෙනි, මුල, මැද, අග යන තුන් තන්හි ම පිරිසිදු වූ අර්ථ සහිත වූ, ව්‍යඤ්ජන සහිත වූ සියල්ලෙන් පිරිසිදු වූ, ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව ඇතුළත් ධර්මය දේශනා කරව්. මේ අනුව දේශනාවේ හෙවත් ප්‍රකාශනයේ මුල මැද අග යන ස්ථාන තුනේ ම සාර්ථකත්වය තිබිය යුතු ය. ප්‍රකාශනයක මෙම එක් ස්ථානයක් හෝ අසාර්ථක නම් ග්‍රාහකයාට එහි නියම ප්‍රයෝජනය ලබාගැනීම දුෂ්කර විය හැකි ය. එමෙන් ම ප්‍රකාශය අර්ථවත් වූ ද ව්‍යඤ්ජන සහිත වූ ද එකක් විය යුතු අතර එය සෑම අංශයකින් ම පරිපූර්ණ වූවක් විය යුතු ය. එනම් ප්‍රකාශනය සාර්ථක වීමට භාෂාව අර්ථවත්ව භාවිත කළ යුතු අතර ම එය ප්‍රකාශන ශක්තියෙන් යුක්ත විය යුතු ය. ඒ තුළ අඩුපාඩු නොතිබිය යුතු ය. මේ ආකාරයට සකස් වූ ප්‍රකාශනය ඵලදායක එකක් බවට පත්වෙයි. බුදුරජාණන් වහන්සේ ගේ සෑම දේශනාවක් ම උක්ත ප්‍රකාරයෙන් පිරිසිදු වූවාහු වෙති.

බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනාවන්හි දක්නට ලැබෙන තවත් සුවිශේෂ ලක්‍ෂණ කිහිපයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. එනම්, ''ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානිකම්මං''[11] යන පද ව්‍යවහාරයයි.

බුදුරජාණන් වහන්සේ ධර්‍මදේශනා කිරීමේ දී මෙම අංග සියල්ල උපයෝගී කරගත් බව සූත්‍ර දේශනා වලින් පැහැදිලි වෙයි. එය උන්වහන්සේගේ දේශනාවන්හි අන්තර්ගත වන සුවිශේෂ දේශනා විලාශයක් ලෙස දැක්විය හැකි ය. මෙම ක්‍රමෝපායයන්ගෙන් අදහස් කළේ කුමක්දැයි විමසා බැලීම මෙහිලා වැදගත් වේ. මේ සෑම පදයකට ම අර්ථ දෙක බැගින් මහානාම හිමියෝ ස්වකීය පටිසම්භිදාමග්ගට්ඨ කථාවේ දී දක්වති. ''ආචික්ඛනා'' යනු දේශනා කළ යුතු සත්‍ය ආදීන්ගේ මේ නම් යැයි නම් වශයෙන් කීමයි. නැතහොත් දේශනාදීන්ගේ සිවුපද අතුරින් මුල් පදයයි. ''දේසනා'' යනු දැක්වීමයි. නැතහොත් උග්ඝටිතඤ්ඤ පුද්ගල ආදීන්ට සංක්ෂේපයෙන් කීමයි. ''පඤ්ඤපනා'' නම් දැන ගැනීමට සැලැස්වීමයි. ඤාණමුඛයේ තැබීමයි. නැතහොත් විපචිතඤ්ඤ පුද්ගලයන් ආදීන්ට පළමුව කෙටියෙන් කියන ලද දෙය විස්තරව නිර්දේශ වශයෙන් පැනවීමයි. ''පට්ඨපනා'' යනු තහවුරු කිරීමයි. නැතහොත් නිර්දේශ කරන ලද දෙය ප්‍රතිනිර්දේශ වශයෙන් විස්තර කොට දැක්වීමයි. ''විවරණා'' නම් විවෘත කිරීමයි. විවෘත කොට දැක්වීමයි. නැතහොත් නිර්දේශ කරන ලද දෙය නැවත නැවත වචනයෙන් විවරණය කිරීමයි. ''විභජනා'' නම් බෙදා දැක්වීම හෙවත් විභාග කොට දැක්වීමයි. විග්‍රහ කොට දැක්වීමයි. නැතහොත් නැවත නැවත කීවේ නමුදු විභාග කරණයෙන් බෙදීමයි. උත්තානිකම්ම නම් ප්‍රකට භාවයට පත් කිරීමයි. හෙවත් විවෘත කර පෙන්වීමයි. නැතහොත් විවෘත වූ දේ විස්තර කරන වචනයෙන් බෙදන ලද දේ නිදර්ශන වචනයෙන් පැහැදිලි කිරීමයි.[12]

ඉහත දක්වන ලද පදයන්ගේ නිෂ්පත්තීන් පිළිබඳව අවධානය යොමු කිරීමෙන් පදගතාර්‍ථයන් මැනවින් අවබෝධ කරගත හැකි ය. ''ආචික්ඛති'' යන්න ආ පූර්‍වඛ්‍යා ධාතුවෙන් සකස් වූවකි. ඒ අනුව එහි අර්ථය පෙන්වීම හෝ ප්‍රකාශ කිරීම යන්නයි. අටුවාචාර්‍ය්‍යයන් වහන්සේ ප්‍රකාශ කරන අන්දමට ''නම් වශයෙන් ලුහුඬින් පෙන්වාදීම'' යන අදහස එයට ගැළපෙන බව පෙනේ. ''දෙසනා'' යන්න දැක්වීම් අර්ථයෙන් දිස් ධාතුවෙන් නිපන්නක් බව පෙනෙයි. එමනිසා කරුණු දැක්වීම යන අදහස දේශනා යන්නට ගැළපෙයි. ''පඤ්ඤපනා'' යන වචන සෑදී ඇත්තේ ප පූර්‍ව ඤා ධාතුවෙනි. මෙයින් යමක් පිළිබඳව මනාව ඥාණනය (අවබෝධ කර ගැනීම) කිරීම දැන ගැනීමට සැලැස්වීම යන අදහස කියවෙයි. ''පට්ඨපනා'' යන වචනය ප පූර්‍ව ඨා ධාතුවෙන් සෑදී ඇත. එයින් කියවෙන්නේ

මනාව පිහිටුවීම යන්නයි. එනම් අර්ථයන්හි මනාව පිහිටුවීම මෙයින් අදහස් වෙයි. ''විවරණා'' යන්නට න ආවරණ යන අර්ථය දිය හැක. එනම් නොවැසීමයි. ආවරණය නොකිරීමයි, අර්ථ එළිදැක්වීමයි. නමුත් වර්තමානයේ මෙම වචනයෙන් විවරණය කිරීම හෙවත් විස්තර කිරීම් යන අර්ථය සඳහා ව්‍යවහාර වන බව පෙනේ. ''විභජනා'' යන වචනය වී පූර්ව භජ් ධාතුවෙන් සෑදී ඇත. ඒ අනුව එයින් බෙදා දැක්වීම් අර්ථය ලැබේ. මෙයින් නිරුක්ති ක්‍රමය සැලකූ බව කිව හැකි ය. උත් පූර්ව තම් ධාතුවෙන් සැදුනු ''උත්තානිකම්මං'' යන වචනයෙන් පිරිසිදු කිරීම විවෘත කිරීම යන අදහස ගෙනදෙන අතර අටුවාවේ දැක්වෙන ප්‍රකට කිරීම යන්නද එයට හොඳින් ගැළපෙයි. මෙයාකාරයෙන් භාෂාමය විධි නියමයන් උක්ත පදයන්ගෙන් ප්‍රකාශ වන බව දැක්විය හැකි ය.

ඉහත විස්තරයේ දැක්වෙන භාෂාමය ක්‍රමෝපායයන් පිළිබඳ අවධානය යොමුකරන විට එහි එක්තරා ක්‍රමානුකූල බවක් ද දක්නට ලැබේ. ග්‍රාහකයාට ආවික්ඛන ක්‍රමයට වඩා දේශනා ක්‍රමය ග්‍රහණය කරගැනීමට පහසුය. උත්තානිකම්ම ක්‍රමයට එන විට ඉතා අඩු ප්‍රඥා ඇති කෙනෙකුට වුවද දේශනාව තේරුම් යනු ඇත. මෙහි දී විවිධ ප්‍රඥාතලයන්ගෙන් යුක්ත පුද්ගලයන්ට ගැලපෙන පරිදි භාෂාව හැසිරවීම කරන අයුරු මෙමගින් දැකගත හැකි ය.

තදනන්තරව බුදුදහම පිළිබඳ ඉපැරණි බෙදීම් ක්‍රමයක් වන නවාංග සත්ථු සාසනය පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූත ධම්ම, වෙදල්ල යනු එම අංග නවයයි. මෙම බෙදීම හුදෙක් ධර්ම කරුණු අනුව නොව බාහිර ස්වරූපය අනුව කරන ලද්දක් වන බව ද පෙනේ. කෙසේ වෙතත් මේ තුළින් ද භාෂාමය සංකල්ප කිහිපයක් විද්‍යමාන වන බව පෙනේ. ඒ අතුරින් වෙය්‍යාකරණ සහ වෙදල්ල යන අංග දෙක භාෂාව සම්බන්ධයෙන් වැදගත් වේ. සමන්තපාසාදිකාවෙහි දැක්වෙන පරිදි අභිධර්මය මෙයට අයත්වේ. (නිග්ගාථක සුත්තං) වෙය්‍යාකරණ අංගය ප්‍රශ්න විචාරාත්මක ක්‍රමය මගින් අර්ථ විග්‍රහ කිරීමක් බව සූත්‍ර දේශනා විමසා බැලීමෙන් පැහැදිලි වෙයි. ''ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ'' යන කියමන සහිත සූත්‍ර දේශනා බොහොමයක් බුදුරජාණන් වහන්සේ විසින් ම ප්‍රශ්න අසා ඒවා විසඳූ අවස්ථා හෝ අන් අයගේ ප්‍රශ්න විසඳූ අවස්ථා හෝ වෙයි. ඒවා බොහෝ දුරට යම් යම් පාරිභාෂික වචන විග්‍රහයන් බව කිව හැකි ය. සමන්තපාසාදිකාවෙහි දැක්වෙන පරිදි ප්‍රීතිය ගෙනහැර දක්වෙන සූත්‍ර වෙදල්ල නමින් හඳුන්වා ඇත. මෙම අංගය ද භාෂාත්මක විග්‍රහයක් විය යුතු ය. යන්න චූල වෙදල්ල මහා වෙදල්ල සූත්‍ර විමසීමෙන් පෙනේ. එහිදී ඉතා සියුම්ව අර්ථ විභජනය කරන ආකාරය දැකිය හැකි ය. මෙසේ බුදුරජාණන් වහන්සේගේ දේශනා ක්‍රමය සහ ප්‍රකාශනය පිළිබඳ උන්වහන්සේ දරූ ආකල්පය විමසා බැලීමෙන් භාෂාව පිළිබඳ අවධානය යොමු කිරීම බුදු දහම සම්බන්ධයෙන් කොතෙක් දුරට වැදගත් වේදැයි පැහැදිලි වේ.

භාෂාව පිළිබඳ ස්වකීය ශ්‍රාවකයන් තුළ අභිප්‍රේරණයක් හෙවත් පෙළඹවීමක් ඇති කරණු වස් බුදුරජාණන් වහන්සේ විසින් ස්වකීය ශ්‍රාවකයන්ට තනතුරු පිරිනැමීමේ දී ලබාදී ඇති තනතුරු රාශියක් ම භාෂාව සම්බන්ධ නිපුණතාව පදනම් කොටගෙන ප්‍රදානය කර ඇති බව දක්නට ලැබේ.[13] පහත දැක්වෙන්නේ එම තනතුරු සහ ඒවා ලබාගත් ශ්‍රාවක ශ්‍රාවිකාවන් ය.

සීහනාද කරන්නන් අතර අග්‍රස්ථානය - පිණ්ඩෝල භාරද්වාජ ස්ථවිර

මිහිරි ස්වර ඇත්තන් අතර අග්‍රස්ථානය - ලකුණ්ට භද්දිය ස්ථවිර

| | | |
|---|---|---|
| ධර්ම කථිකයන් අතර අග්‍රස්ථානය | - | පුණ්ණමන්තානිපුත්ත ස්ථවිර, ධම්මදින්නා තෙරණිය |
| කලණ බස් ඇත්තවුන් අතර අග්‍රස්ථානය | - | සෝණකුටිකණ්ණ ස්ථවිර |
| සැකෙවින් කියූ දෙය විස්තර කරන්නන් අතර අග්‍රස්ථානය | - | මහා කච්චාන ස්ථවිර |
| පිරිපුන් වැටහීම් ඇත්තවුන් අතර අග්‍රස්ථානය | - | වංගීස ස්ථවිර |
| සිව් පිළිසිඹියා පත්වූවන් අතර අග්‍රස්ථානය | - | මහා කොට්ඨිත ස්ථවිර |
| විසිතුරු ධර්ම කතා ඇත්තවුන් අතර අග්‍රස්ථානය | - | කුමාර කාශ්‍යප ස්ථවිර |
| ධර්ම දේශනා වටහා ගැනීමට සුදුසු කථා ඇත්තවුන් අතර අග්‍රස්ථානය | - | රාධ ස්ථවිර |

යථෝක්ත තනතුරු සියල්ල භාෂාව පදනම් කොටගෙන ලබාදුන් තනතුරු බව ප්‍රකට වේ. ඒ අතුරින් ඇතැම් පදවි භාෂාව භාවිත කිරීමේ දී භාෂාව උපයෝගී කරගැනීම පිළිබඳ ඒවා වන අතර ඇතැම් පදවි සන්නිවේදනය ග්‍රහණය කිරීමේ භාෂාමය හැකියාව පිළිබඳ වූ ඒවා වෙයි. එසේ ම මෙහි අංක එක සහ දෙක කට හඬ සම්බන්ධ වූ ඒවා වන අතර හයවැන්න අවබෝධය සම්බන්ධ එකක් වෙයි. ඉතිරි සියල්ලක් ම සන්නිවේදනය සඳහා භාෂාව භාවිත කිරීමේ දී උපයෝගී කරගනු ලබන ක්‍රමෝපායයන්ට අදාළ තනතුරු වෙයි. මේ ආකාරයට බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන්ට පිරිනමන ලද තනතුරු අතර ඉතා විශාල සංඛ්‍යාවක් සන්නිවේදනය සම්බන්ධ තනතුරු වීමෙන් අපට හැඟී යන්නේ භාෂා කෞශල්‍යය ඇතිකර ගැනීම බුදුන්වහන්සේ අගය කළ අතර අන්‍ය භික්ෂූන්ට ද එම හැකියාවන් වර්ධනය කරගැනීමට උනන්දු කර වූ බවයි.

බුදුසමයාගත චතුපටිසම්භිදාවන්ගෙන් ද භාෂාව සම්බන්ධයෙන් වැදගත් කරුණු රාශියක් අන්තර්ගත වන බව පෙනේ.

එනම්,

1. අත්ථපටිසම්භිදා
2. ධම්මපටිසම්භිදා
3. නිරුක්ති පටිසම්භිදා
4. පටිභානපටිසම්භිදා, යනුවෙනි.

චතුපටිසම්භිදා යන්නෙන් අදහස් කරන්නේ රහතන් වහන්සේලා සහ සමහර උපාසක උපාසිකාවන් තුළ දක්නට ලැබුණු විශේෂ හැකියාවන් හතරකි. බුදුසමයෙහි රහතන් වහන්සේලා කොට්ඨාශ දෙකකට අයත් වූහ. සිවුපිළිසිඹියාපත් රහතන් වහන්සේ සහ එසේ නොවන රහතන් වහන්සේලා වශයෙනි. සිවුපිළිසිඹියාපත් රහතන් වහන්සේ නම් ඉහත කී විශේෂ හැකියාවන්

හතරෙන් සමන්විත වූහ. උක්ත පදයන්හි ප්‍රකාශිත අර්ථයන් හඳුනා ගැනීමට විභංගප්පකරණයේ සඳහන් වන විවරණය උපකාර වේ.[14]

මේ ශාසනයෙහි භික්ෂුව සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ජාතක, ඉතිවුත්තක, අබ්භූතධම්ම, වෙදල්ල යන ධර්මයන් දනී ද එය ධම්මපටිසම්භිදා නම් වේ. ඔහු එම ධර්මයන් හි අර්ථය මෙය එම කියන ලද දෙයෙහි අර්ථය යැයි දනිද, එය අත්ථපටිසම්භිදාවයි. ඒ අර්ථයන්හි සහ ධර්මයන්හි යම් ස්වභාව නිරුක්තියක් වේද නිවැරදි ව්‍යවහාරයක් වේද එම භාෂණය අසා මෙය ස්වභාව නිරුක්තියයි. මෙය ස්වභාව නිරුක්තිය නොවේ වශයෙන් ඇතිකර ගනු ලබන ඥාණය නිරුත්ති පටිසම්භිදාවයි. සියලු ඥාණාරම්මනය කොට ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ඥාණාරම්මනය යම් පරිදි කියන ලද්දේ ද එහි හෝ එම ඥාණයන් හි හෝ සගෝචර කෘත්‍යාදි වශයෙන් විස්තරව ඇතිවන ඥාණයක්වේද එය පටිභාණ පටිසම්භිදාවයි.'' ස්වකීය හැඟීම් ශක්තියෙන් අර්ථය විශද කිරීම ද පටිභානිය වශයෙන් හැඳින්විය හැකි ය.

ඉහත අර්ථ දැක්වීම මෙහි දී අපට අතිශයින් වැදගත් වන්නේ මෙයින් භාෂාව සහ එහි අර්ථයන්හි මනා දැනුම පටිසම්භිදා වශයෙන් හඳුන්වා ඇති හෙයිනි. භාෂාව භාවිතා කිරීම පිළිබඳ දැනුම ඉහත කී සියල්ලම පිළිබඳ සමස්තයක් වශයෙන් ගෙන සලකා ඇතිවන දැනුම වශයෙන් මෙහි දී චතුපටිසම්භිදාව පිළිබඳ අර්ථවිග්‍රහය දක්වෙයි. බුදු දහමේ ඉගැන්වෙන විශේස හැකියාවක් වූ චතුපටිසම්භිදාවෙන් කියවෙන්නේ භාෂාමය හැකියාවන් රහතන් වහන්සේලාට මෙන් ම රහත් මගට පිවිසි ආනන්ද තෙරුන් වැනි අයටත් තිබුණු බවයි. එමෙන් ම චිත්තගහපති, ධම්මික උපාසක, උපාලි ගහපති, ඛුජ්ජුත්තරා උපාසිකාව ආදීන්ටත් එවැනි උපනිශ්‍රය සම්පත්තියක් තිබූ බව සඳහන්ව ඇත. මෙසේ භාෂාමය හැකියාව විශේෂ ඥාණ ප්‍රභේද හතරක් ලෙස දැක්වීමෙන් භාෂාව පිළිබඳ බුදුදහම දක්වන දැඩි ආකල්පය ප්‍රකට වේ.

තදනන්තරව විනය කර්ම කිරීමේ දී භාෂා ව්‍යවහාරය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම කෙතරම් වැදගත් වන්නේදැයි විසමා බලමු. විනය කර්ම වලදී භාෂා භාවිතය සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේගේ විශේෂ අවධානය යොමුවී ඇති ආකාරය විනය පිටකයෙන් පැහැදිලි වේ. යම්කිසි විනය කර්මයක් කිරීමේ දී පළමුවෙන් ඤත්තිය හෙවත් දැනුම් දීම සඳහා භාවිත වන විනයානුකූල ක්‍රමයක් ඇත. මෙහි දී සාම්ප්‍රදායිකව භාවිත වන වචන සමූහයක් මගින් ඤත්තිය හෙවත් නිවේදනය කරනු ලැබේ.[15] ඊට වෙනස් අයුරකින් වෙනත් වචන භාවිත කරමින් එය කළ නොහැක. ව්‍යවස්ථා සම්ප්‍රදානයේ දී එයට අනුකූල යම් යම් භාෂා ප්‍රයෝග උපයෝගී කරගැනීම දැනුදු දක්නට ලැබේ. යම්කිසි පනතක් සකස් කිරීමේ දී එය කරනු ලබන්නේ පිළිගත් එක්තරා භාෂා ක්‍රමයකට අනුව ය. එසේ ම භික්ෂූන්ගේ සංඝ කර්මවලදී යම් යම් දැනුම් දීම කරන ලද්දේ පිළිගත් භාෂා ප්‍රයෝග මාර්ගයෙනි.

> 'සුණාතු මෙ භන්තෙ සංඝො, යදි සංඝස්ස පත්තකල්ලං සංඝො උපොසථං කරෙය්‍ය
>
> පාතිමොක්ඛං උද්දිසෙය්‍ය''

යනාදී වශයෙන් සියලු ම විනය කර්මවලදී භාවිත වන වාග් විඥප්තියෙහි එක ම පිළිවෙළක් දැකිය හැකි ය. මෙම පිළිවෙළ බිඳ විනය කර්‍ම කිරීම අසම්භාවිතය. මෙසේ විනය කර්‍මවල දී භාවිත වන

භාෂාව පිළිබඳ යම් නීත්‍යානුකූල ක්‍රමයක් අනුගමනය කිරීමෙන් පෙනීයන්නේ භාෂාව විනය දේශනා සම්බන්ධයෙන් අතිශය වැදගත් වූ බවයි.

එසේ ම විනය කර්‍ම කිරීමේ දී ද භාෂාව පිළිබඳ විශේෂ අවධානයක් යොමුකොට ඇති බව පෙනීයයි. විශේෂයෙන් විනය දේශනා කිරීම සඳහා තෝරාගන්නා භික්ෂුව ව්‍යක්ත විශාරද ප්‍රතිබල සම්පන්න කෙනෙකු විය යුතු ය. ''ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන'' යනුවෙන් ඒ බව සඳහන් වේ.[16] මුලින් සංඝස්ථවිරයන්ට පැවරුණු පාතිමොක්ඛුද්දේසය උන්වහන්සේ අව්‍යක්ත අප්පටිබල කෙනෙකු නම් ව්‍යක්ත පටිබල කෙනෙකුට එය පැවරිය යුතු ය. යම් හෙයකින් යෝග්‍ය වූ භික්ෂුන් වහන්සේ නමක් නැතිනම් සමීප ආවාසයකට ගොස් ප්‍රාතිමෝක්ෂය ප්‍රගුණ කරවා ගෙන හෝ ගෙන්වා ගත යුතු ය.[17] මෙසේ සංඝ කර්ම කිරීමේ දී ව්‍යක්ත ප්‍රතිබල භික්ෂුවක් තෝරාගත යුතු යැයි ප්‍රකාශ කොට ඇත්තේ භාෂාව මනා ලෙස උච්ඡාරණය කිරීම, පද භාවිතය සම්බන්ධ ගැටලු පැන නගින නිසා බව පෙනී යයි.

මෙහි ව්‍යක්ත, පටිබල යන වචන දෙක භාෂාව සම්බන්‍ධයෙන් අපට වැදගත් වේ. මෙයින් අදහස් කරන ලද්දේ භාෂා ව්‍යවහාරයේ නිපුණතාවක් ඇතිවීම බව අටුවාව විමසා බැලීමෙන් පෙනී යයි. ව්‍යක්ත පටිබල යන වචන දෙක සමන්තපාසාදිකා අටුවාවෙහි විස්තර කොට ඇත්තේ මෙසේ ය. මෙහි ව්‍යක්ත නම් යමෙකුට අට්ඨකථා හිත විනය පිටකය කට පාඩම්ව පවතී ද, එසේ නොමැතිනම් යමෙකුට යටත් පිරිසෙයින් මෙම ඤත්ති චතුත්ථකම්ම වචන මාත්‍රයවත් මනාව ගෙන තිබෙද, කට පාඩම්ව තිබේ ද, එය මෙම අර්ථයේ ව්‍යක්ත නම් වෙයි. යමෙක් වනාහි කාස සෙම් ආදියෙන් හෝ තොල් දත් දිව ආදියේ රෝග බවකින් හෝ පරියාප්තියට නොපැමිණීමෙන් හෝ නොකරන ලද පරිචයෙන් සපුරා පදව්‍යඤ්ජනයන්ගෙන් යුක්තව කර්ම වාක්‍ය කීමට නොහැකි වෙයි. ව්‍යඤ්ජන හෝ පද හෝ පිරිහෙළයි. කිව යුතු දෙය තිබිය දී වෙන දෙයක් කියයි. මෙය අප්පටිබල නම් වෙයි. එම තත්වයන්ගෙන් තොරවීම පටිබල වේ යැයි දත යුතු ය''[18] යනුවෙන් සඳහන් වේ.

මේ අනුව පෙනී යන්නේ උච්චාරණ ආදී භාෂා ප්‍රයෝග පිළිබඳව මනාවබෝධයක් විනය කර්‍ම කිරීමේ දී වැදගත් වන බවයි. කිසියම් කර්ම වාක්‍යයක් දේශනා කිරීමේ දී එහි පද හා අක්ෂර අත් නොහැර ඒවා නිසි පරිදි ශබ්ද කිරීම වැදගත් කොට සලකා ඇති බව මෙමගින් පැහැදිලි වේ. එසේ ම පද වැරදි ලෙස උච්චාරණය කිරීමෙන් හෝ අත්හැර උච්චාරණය කිරීමෙන් විනය කර්මයක් නිසි පරිදි සිදුනොවන බව පෙනේ.

එතකුදු නොව විනය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ඒවා සාකච්ඡා කළ යුතු හා නොකළ යුතු පුද්ගලයන් පිළිබඳව පරිවාරපාළියේ සඳහන් වේ. පරිවාරපාළියේ උපාලිපඤ්චකයේ මෙම සඳහන් කිරීම් අන්තර්ගත වෙයි. එහි දී අංග පසකින් යුක්ත භික්ෂුව සමඟ විනය සාකච්ඡා නොකළ යුතු බව බුදුරජාණන් වවහන්සේ පෙන්වා දෙති. වස්තුව නිදානය, ප්‍රඥප්තිය, පදපෙරළිය හා උචිත වචන මාර්ගය නොදනී ද එබඳු භික්ෂුව සමඟ විනය සාකච්ඡා නොකළ යුතු යැයි එහි සඳහන් වේ.[19] ඉහත කී කාරණා දන්නා වූ භික්ෂුව සමඟ විනය සාකච්ඡා කළ යුතු බව තවදුරටත් එහි සඳහන් වෙයි.

මෙහි අවසාන කාරණා දෙක වන පද පෙරළිය සහ උචිත වචන මාර්ගය යන කරුණු මෙහිලා ඉතා වැදගත් වේ. මෙහි පද පෙරළිය වශයෙන් හඳුන්වා ඇත්තේ කුමක් ද? යන්න විමසා බැලිය යුතුය. භාෂාවේ වචන යෙදීමේ එක්තරා පද පිළිවෙලක් පවතින බව දැකිය හැකි ය. යම් යම් පද මුලින් ද අනික් පද පසුව ද යෙදීමේ පිළිගත් ක්‍රමයක් වෙයි. මෙම පිළිවෙල නොදන්න

තැනැත්තා වැරදි පද පිළිවෙලක් අනුගමනය කරයි. උදාහරණ වශයෙන් ''බුද්ධෝ භගවා'' යැයි කිය යුතු තැන ''භගවා බුද්ධෝ'' යනුවෙන් කෙනෙකුට භාවිත කළ හැකි ය. එහෙත් එම භාවිතය සාවද්‍ය වේ. අර්ථයට හානියක් සිදුනොවෙතත් දේශනා ශෛලියට සහ සුබොච්ඡාරණයට හානියක් සිදුවන බව ප්‍රකට වේ. එබැවින් මෙසේ වැරදි ලෙස පද යෙදීම යෝග්‍ය නොවේ. ඒ පිළිබඳ නොදැනීම පද පිළිවෙල නොදැනීමයි. විනයේ දී භාවිත කළ යුතු ගැලපෙන වචන සමූහයක් වෙයි. ආපත්ති, පඤ්ඤත්ති, වත්ථු, නිදාන, අනාපත්ති ආදී වශයෙන් විනයට ම ආවේණික වූ පාරිභාෂික වචන මාලාවක් වෙයි. එම වචනවලින් කියවෙන අදහස් ඇති වජ්ජ, නය, හේතු අනවජ්ජ වැනි වෙනත් පද තිබිය හැකි ය. නමුත් විනය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී එය අදාළ පාරිභාෂික වචන භාවිත කළ යුතු ය. එබඳු වචන නොදන්නාකම ''අනුසන්ධි වචන පථං න ජානන්ති'' යනුවෙන් දක්වා ඇත. මෙසේ පද පිළිවෙල නොදැනීම සහ සුදුසු වචන මාර්ගය නොදැනීම විනය සාකච්ඡා සඳහා නුසුදුසු කමක් වෙයි. විනය කරුණක් සාකච්ඡා කිරීමේ දී පවා ඒවා සාකච්ඡා සඳහා නුසුදුසු කමක් වෙයි. විනය කරුණක් පිළිබඳ සාකච්ඡා කිරීමට වුව ද සුදුසු වන්නේ භාෂාව පිළිබඳ මනා දැනුමක් ඇත්තකු සමඟ බව සඳහන් වේ.

උක්ත කරුණු ආශ්‍රයෙන් විනය සම්බන්ධයෙන් භාෂා දැනුම අවධාරණය කොට ඇති ආකාරය අපට පැහැදිලි වෙයි. අක්ෂර, පද, භාවිතය පිළිබඳ කෙතරම් අවධානය යොමු කොට ඇද්ද, යන්න පසක්කර ගැනීමට ගිහියෙකු පැවිදි කිරීම සඳහා තිසරණය දීමේ දී අනුගමනය කරන ක්‍රමය විමසා බැලීමෙන් පැහැදිලි වේ. යම්කිසි ස්ථානයක යෙදිය යුතු නියමිත අක්ෂරය කුමක්දැයි අපැහැදිලි වූ අවස්ථාවක අක්ෂර දෙක ම යොදා ව්‍යඤ්ජන හානිය වලක්වා ගැනීමට උත්සාහ කර ඇති බවත්, ඒ සඳහා උපදෙස් දී ඇති බවත් සමන්තපාසාදිකාව විමසීමෙන් පෙනී යයි. එහි අට්ඨ කථාවෙහි සඳහන් වන ආකාරය අනුව ''බුද්ධං සරණං ගච්ඡාමි'' යනුවෙන් අනුස්වරාන්තව ද ''බුද්ධම් සරණම් ගච්ඡාමි'' යනුවෙන් මකාරාන්තව ද තිසරණය සමාදන් කරවීම සිදුකළ යුතු ය. එසේ ම බුද්ධං සරණං ගච්ඡාමි යනාදී වශයෙන් තිසරණය අනුපිළිවෙළින් දිය යුතු ය. මෙම සරණය දීමේ දී ඒ සඳහා මුල්වන ආචාර්යවරයා සහ අන්තේවාසිකයා යන දෙදෙනාම නිසි පරිදි වචන උච්චාරණය කළ යුතු බව ද සඳහන් වේ.[20]

සමස්තයක් වශයෙන් ගත් කළ සූත්‍ර, විනය, සහ තදනුගත අට්ඨකථාවන් ආශ්‍රයෙන් භාෂාවේ ඇති වැදගත්කම සහ භාෂා ව්‍යවහාරය සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු ආකාරය මැනවින් විවරණය වී ඇති බැවින් බුදුසමය භාෂා ව්‍යවහාරය පිළිබඳ දක්වන ආකල්පය අතිශයින් වැදගත් වන බව පෙන්වා දිය හැකි ය.

## ආන්තික සටහන්

---

[1] මජ්ඣිම නිකාය, 1, 408, පිට, බු: ජ: මු:
[2] එම, 410 පිට,
[3] අංගුත්තර නිකාය, 1, 106 පිට, බු: ජ: මු:
[4] චුල්ලවග්ග පාළි, බුද්දවත්‍ථු, 100 පිට බු: ජ: මු:
[5] -එම-
[6] සමන්තපාසාදිකා අට්ඨ කථා, 897 පිට, හේවාවිතාරණ සංස්කරණය,
[7] මජ්ඣිම නිකාය, අරණ විභංග සුත්ත, 1, 490, පිට, බු: ජ: මු:
[8] අංගුත්තර නිකාය, 3, 300 පිට, බු: ජ: මු:
[9] -එම-
[10] මහාවග්ගපාළි, 1, 42 පිට, බු: ජ: මු:
[11] මජ්ඣිම නිකාය, III, 512, පි. බු: ජ: මු:
[12] පටිසම්භිදාමග්ගට්ඨකථා, 411 - 412, පී. හේවාවිතාරණ මූ:
[13] අංගුත්තර නිකාය, 1, 46 පි. බු: ජ: මු:
[14] විභංගප්පකරණ, 11, 118 - 120, පි. බු: ජ: මු:
[15] මහාවග්ගපාළි, 2, 630, පි. බු: ජ: මු:
[16] මහාවග්ගපාළි, 1, 302, පි. බු: ජ: මු:
[17] -එම-
[18] සමන්තපාසාදිකා විනයට්ඨ කථා
[19] පරිවාරිපාළි
[20] සමන්තපාසාදිකා